# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


අංක 2163/18 – 2020 පෙබරවාරි 18 වැනි අඟහරුවාදා – 2020.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උපවගන්තිය යටතේ, ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය, සමරකෝන් මුදියන්සේලාගේ චන්ද්‍රසේන වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කිණිගොඩ කෝරළේ සුළු කොට්ඨාසයේ, අංක 03, නත්තඹුර ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කාඩවට්ටිය (අ.ග.පි 141) ගමෙහි පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේජ්/ආර්එම්බී/2018/285 හා 2019.02.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – බමුණුමුල්ලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0018ක් පමණ**

උතුරට: බමුණුමුල්ලේවත්ත, මාර්ගය සහ කැබලි අක්ෂර බී; නැගෙනහිරට: කැබලි අක්ෂර බී; දකුණට: මාර්ගය සහ බමුණුමුල්ලේවත්ත; බටහිරට: බමුණුමුල්ලේවත්ත.

02. **කැබලි අක්ෂර 'බී' – ප්‍රමාණය: හෙක්. 0.0024ක් පමණ**

උතුරට: බමුණුමුල්ලේවත්ත සහ කැබලි අක්ෂර සී; නැගෙනහිරට: කැබලි අක්ෂර සී; දකුණට: මාර්ගය සහ බමුණුමුල්ලේවත්ත සහ කැබලි අක්ෂර ඒ; බටහිරට: කැබලි අක්ෂර ඒ, බමුණුමුල්ලේවත්ත සහ මාර්ගය.

03. **කැබලි අක්ෂර 'සී' – බමුණුමුල්ලේවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0259ක් පමණ**

උතුරට: බමුණුමුල්ලේවත්ත, ගොරකඅංගකුඹුර සහ කැබලි අක්ෂර ඩී; නැගෙනහිරට: කැබලි අක්ෂර ඩී; දකුණට: අගපි 141 හි කැබලි අංක 132, 131, බමුණුමුල්ලේවත්ත සහ මාර්ගය; බටහිරට: මාර්ගය, කැබලි අක්ෂර බී සහ බමුණුමුල්ලේවත්ත.

04. **කැබලි අක්ෂර 'ඩී' – ගොරකඅංගකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0551ක් පමණ**

උතුරට: ගොරකඅංගකුඹුර; නැගෙනහිරට: ගොරකඅංගකුඹුර සහ කැබලි අක්ෂර ඒ; දකුණට: අගපි 141 හි කැබලි අංක 139, 132 සහ 131 මාර්ගය; බටහිරට: අගපි 141 හි කැබලි අංක 131 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර සී.


1A – G 32057 – 21 (2020/02)



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

05. **කැබලි අක්ෂර 'ඊ' – ගොරකඅංගකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0094ක් පමණ**

උතුරට: ගොරකඅංගකුඹුර; නැගෙනහිරට: ගොරකඅංගකුඹුර සහ කැබලි අක්ෂර එෆ්; දකුණට: අගපි 141 හි කැබලි අංක 143 සහ 139; බටහිරට: අගපි 141 හි කැබලි අංක 132 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර ඩී.

06. **කැබලි අක්ෂර 'එෆ්' – ගොරකඅංගකුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0001ක් පමණ**

උතුරට සහ නැගෙනහිරට: ගොරකඅංගකුඹුර; දකුණට: අගපි 141 හි කැබලි අංක 143 සහ 139; බටහිරට: අගපි 141 හි කැබලි අංක 139 සහ මෙම අනුරේඛණයේ කැබලි අක්ෂර ඊ.

එස්. එම්. චන්ද්‍රසේන,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ අංකය: 4-3/7/2018/HW/382.
2020 ජනවාරි මස 08 වැනි දින,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

03 - 41

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.